

# දිනපොතක සටහන්

**විසිවැනි සියවසේ මෙරට බෞද්ධ හා ජාතික පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකළ එල්. එච්. මෙත්තානන්ද මහතාගේ දිනපොතින් උපුටාගත් කොටසක් "කොලොම්පුරේ අපි" වෙත එවන ලද්දේ ඒ මහතාගේ දියණියක වන වෛද්‍ය කමලාදේවි එදිරිවීර මහත්මිය විසිනි.**

1915 ජුනි මස පළවෙනිද

මෙදින මම දෙවෙනි වරටද ආධුනික බළකායට බැඳුණෙමි. මීට හේතුව කොළඹ නගරය පුරා කල කෝලාහල උද්ගත වී තිබීමය. අනිකුත් ශිෂ්‍යයින් සමග මම විදුහලෙන් පිටවී හමුද මූලස්ථානයට ගියෙමි.


එහිදී සෙන්පතිතුමාගේ අණ පරිදි අපි නගරයේ නොයෙකුත් ස්ථාන වෙත යවන්න පටන්ගතිමු. නගරය ආරක්ෂා කිරීමට සහ මංකොල්ලකෑම පැතිර යෑම නතර කරන්න අපට අණ දී තිබුණි.

සවස 7 ට පමණ මා සිටි බළඇණිය, ලොකු ලොරියකින් යැව්වේ වික්ටෝරියා පාළම අසලටය. කැරැලිකරුවන් පාළම හරහට නගරයට ඇතුල්වීම වළක්වන්න අපේ සහායට නගර ආරක්ෂක භටයින්ද (Town guards) අප සමග එක්වූහ. කිසිම දවසක දැක නැති නාඳුනන මිනිසුන් කණ්ඩායමක් සමග මම මුර වැඩෙහි යෙදුණෙමි.

මුළු රාත්‍රි කාලයේම වෙඩි උණ්ඩ පිරි තුවක්කු රැගෙන අපි පාළම ආරක්ෂා කළෙමු. පාලම ඈත කෙළවර මුරකළ පොලිස් නිලධාරීන් දෙදෙනා මුදහැර, ඔවුන්ගේ රාජකාරිය අපි භාර ගත්තෙමු. එම වේලාවේ අප සමග සිටි සෙබළුන් දෙදෙනෙක් කැරැලිකරුවන් විසින් පැහැරගෙන ගිය බවටද ආපසු අප කණ්ඩායමට එක් නොවූ බවටද කටකථාවක් පැතිර ගියේය.

වේලාව මැදියම් රෑ 12 ට පමණ විය. අසල නිවසක කාරුණික මහතෙක් සිය වාහනය කොළඹ හෝටලයකට යවා, අපට කෑම ගෙන්වා දුන්නේය. පාන් සහ සිසිල් බීම අපට ලැබුණි. එතුමා අපට කළ උපකාරය මට කිසිද අමතක නොවනවාට කිසිම සැකයක් නැත. පසුද උදේ අධික කුසගින්න සහ නිදිමත වීම නිසා තෙහෙට්ටු ගතියක් දැනුණි. උදේ 7 ට පමණ පාගමනින් පිටත් වුණේ සැතැප්ම 5 ක් පමණ ඈත වූ හමුද මූලස්ථානයටය. මග දෙපස විනාශ වූ ගොඩනැගිලිද, මංකොල්ලකා කුඩු කරන ලද කඩ සාප්පුද අපට දැකගත හැකි විය. සිය ගණන් මිනිස්සු මග දෙපස සැරිසරනවා දැක්හ. සමහරු පළිගැනීමේ අදහසින් සිටින බව අපට දැනිණි. සාගින්නේ පෙළෙන මිනිසුන්ගේ ස්වරූපය ඔවුන්ට තිබුණි.

එක් පුද්ගලයෙක් ඉතා කණගාටුවෙන් අපගේ පිහිට පැතුවේ ඔහුගේ නිවස කරා යෑමටය. නැතහොත් කැරැලිකරුවන්ගේ තාඩන පීඩනවලට මුහුණ දීමට සිදුවෙනවාට කිසිදු සැකයක් නැති බව ඔහු දැන සිටියේය. අපි ඔහු ආරක්ෂිත ස්ථානයකට රැගෙන ගියෙමු. රථවාහන හෝ රික්සෝ රථ දක්නට ලැබුණේ නැත. නගරයේ රමණීය වීදි මෙද, ඉතා දුක්බර දර්ශනයක් විය. විනාශ වූ දේපළ විස්තර කරන්න බැරි තරම්ය.



June 1st 1915
On this day I was
mobilized for the second
time. The occasion
was the riots in Colo[illegible]
between the [illegible]
[illegible]
from the college along
with my fellow students
to the Volunteer Hd. Qrs.
at about 5.30 P.M. we left
for the Military Barrack
where C.T.G. and
C.P.R.C men were
present. Under orders
from the Brigadier-Gen-
eral we were sent
to different places
in the city in order
to protect them from
onrushing rowdies
and to prevent as
far as possible the

ග්‍රෑන්ඩ්පාස් වීදිය ඔස්සේ ගමන් ගත් අපි හමුද මූලස්ථානයට ළඟා වුණෙමු. ලෙමනේඩ්වලින් අපගේ අධික පිපාසය සංසිඳුවා ගත්හ. මිලිටරි බැරැක් එකට ගොස් මඳ වේලාවක් විවේකීව සිටින්නට ලැබුණි. එහිදී අපට ලැබුණු ආරංචි අනුව, බොරැල්ල සහ වැල්ලවත්ත ප්‍රදේශවල ඉතා දරුණු සටන් පැවැතිණ.

මුරකාවල්වල සිටි භටයින් මාරු විය. දහස් ගණන් කැරැලිකරුවන් දක්නට ලැබුණි. ග්‍රෑන්ඩ්පාස් මංසන්ධියේදී අපට පළතුරු සංග්‍රහයක් ලැබුණි. තුවක්කු සහ බයිනෙත්තු අප අත තිබුණි. වෙඩි උණ්ඩ 5 බැගින් අප සියලු දෙනාටම ලැබුණි. නොවැළැක්විය හැකි හේතුවක් ඇරෙන්න වෙඩි තියන්න එපා කියා අපට අණ ලැබුණි. අපි සේදවත්ත පාර දිගේ ඉදිරියට ගමන් ගතිමු. කැලණි ගඟේ වම් ඉවුරේ තැනින් තැන මුරකාවල් තිබුණි. ගඟ හරහා බෝට්ටු පැදවීම තහනම් කර තිබුණි. ගඟේ ඈත බෝට්ටුවක් පදවනවා දැක වෙඩි තබා පළවා හැරියෙමු.

සේදවත්ත සහ අවට ගම්වලින් ආ කැරැලිකරුවන් කොටුව සහ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශවල විශාල විනාශයක් කර තිබුණි. එබැවින් සැලකිය යුතු හමුදවක් මේ පාළම ළඟ මුර කරන්නට සිටියේය.

එහි වීදිවල සක්මන් කළමිනිසුන් කැති පොරෝ, කඩු, යකඩ පොලු ආදිය රැගෙන සිටි නිසා අපි තුවක්කු පාවිච්චි කරන්න සූදනමින් සිටියෙමු. බැලූ බැල්මට ඔවුන් අහිංසක මිනිසුන් මෙන් පෙනුණි. එහෙත් අප විමසිල්ලෙන් සිටි නිසා ආයුධ සඟවා ගෙන යන විදිය අපට දක්නට ලැබුණි.

අප කණ්ඩායමේ වැඩිදෙනා ඔවුන්ගේ ජන කොටසට අයිති වූහ. එබැවින් ඔවුහු සිය අත තිබූ ආයුධ පසෙක දමා එතනින් පිටවී ගියහ. සිංහල ජාතියට අගෞරව වෙන නීති විරෝධී වැඩ කරන්න එපා කියා අපි ඔවුනට අවවාද දුනිමු.

උදේ 8.30 ට පමණ තවත් භට කණ්ඩායමක් ඇවිත් අප මුදවා හරින ලදී. එම ලොරියේම නැගී අප ගියේ පොලිස් මූලස්ථානයටය. මේ වන විට (Marshall Law) ඇඳිරි නීතිය පනවා තිබුණි.

සවස 6 ට පමණ නාරන්පිටියට යෑමට අපට නියෝග ලැබුණි. එහි ගොස් පාරවල් 4 ක් මුර කරන්නට වුණි. අවට ගම්වලින් එන කැරැලිකරුවන් මේ පාරවල් ඔස්සේ නගරයට පිවිස කොල්ලුපිටියට සහ වැල්ලවත්තට ගොස් කඩ සාප්පු විනාශ කර ඇත.

සවස 7 ට පමණ අපි නාරන්පිටියට ගොස් මුර වැඩ ආරම්භ කළෙමු. අපි කුඹුරු යායක් මැදින් යන පාරක් මුර කරන්න පටන් ගතිමු. අයහපත් කාලගුණයක් පැවැතිණ. වැස්ස පටන් ගත්විය. අප සියලු දෙනාම ඉතා අසරණ තත්ත්වයක සිටියහ. වැස්සට අඳින ඇඳුම් අපට තිබුණේ නැත. සමහරු පොල් කොළ වලින් හිස් වසාගෙන තිබුණි. වැඩිදෙනා වීදි සංචාරය කරමින් ආරක්ෂක කටයුතුවල යෙදුණි. සුළු පිරිසක් තෙත පොළවේ ලැගුම් ගත්හ.

ආරක්ෂක කටයුතුවලට සහභාගි වෙන්න මගේ වාරය එළඹුණා පමණයි. ඈතින් යම්කිසි එළියක් දිස්වුණි. ටෝච් එළියක් වගේ පෙණුනි. සටනකට මුණදීමට අපි සැරසුණෙමු. එළිය ළඟටම එනකොට අප අතර යම්කිසි කලබලකාරී තත්ත්වයක් ඇතිවුණි. අප බලාපොරොත්තු වුණේ විශාල සෙනඟක් එක්ක සටනක් ආරම්භ කරන්නය. (Halt!!) නවතිනු කියා අප කෑගැසුවෙමු. අප ළඟට ඇවිත් සිටියේ ඉතා අසරණ වූ මිනිසුන් කණ්ඩායමකි. කාන්තාවන් කීපදෙනෙක් ද වූහ. දෙදෙනෙක් දවස් 6 ක් පමණ වයස ඇති කිරි දරුවන් දෙදෙනකු වඩාගෙන සිටියහ.

ඉතා ශෝකජනක අවස්ථාවකි. දින කීපයකට පෙර මරණීය තර්ජනයක් තිබුණ බවද, කුසගින්නේ කැළේක සැඟවී සිටි බවද අපට දැන්වූහ. ඔවුන්ගේ සියලුම දේපළ නැතිවී තිබුණි. එහි තිබුණ රජයේ ගොඩනැගිල්ලක රාත්‍රිය ගත කළ ඔවුන් පසුද නගරයේ ආරක්ෂිත ස්ථානයකට පිටත් කරන ලදී.

උදේ ආහාරයට යම්කිසි දෙයක් ලැබුණි. එය වහා ගිලගත් අපි ලොරියකින් පොලිස් බැරැක් (Barrack) එකට ගියෙමු. මුස්ලිම් දේවස්ථානය අවට දහස් ගණන් මිනිසුන් සිටින බව පෙනුණි. සිකුරාද දවල් 12 ට පමණ විය. සිවිල් ඇඳුමින් සිටි තුවක්කු රැගත් භටයින් එහි සිටිනවා දැක අපි පුදුම වුණෙමු.

එක භටයෙකුට වෙඩි උණ්ඩ 80 බැගින් බෙදන ලදී. දවල් 1.30 ට පමණ පිටකොටුවට ගමන් ගත්හ. ඩාර්ලි පාර ඔස්සේ ගමන් ගත් අපි දුම්රිය වැඩපොළ (Railway Yard) අසලට ආවෙමු. පිටකොටුවෙන් පැන යන කැරැලිකරුවන්ට වෙඩි තැබීමට සහ බයිනෙත්තු පාවිච්චි කිරීමට අපට අණ ලැබුණි.

(C L I) හමුදව විසින් පිටකොටුව වටකර තිබුණි. සියලුම ගොඩනැගිලි සෝදිසි කර තිබේ. යකඩ පොලු සහ අනිකුත් ආයුධ විශාල තොගයක් රැගත් කරත්ත, පොලිසියට ගෙන තිබේ. පැන යන්න තැත්කළ කැරැලිකරුවන් විශාල පිරිසක් වෙඩි තබා මරන්න ඇත.

සවස් වන විට නැවතත් පොලිසියට පැමිණ රාත්‍රි 10 ට වගේ රාත්‍රි ආහාර ගත් අපි නින්දට ගියෙමු. දින කීපයකට පසු සැපසේ නිද ගන්න ලැබුණි. මැදියම් රෑ කඩා වැටුණු ධාරානිපාත වර්ෂාව නිසා අප නිද සිටි තැන වතුරට යට විය. නින්දෙන් අවදි වූ අප උස ඉස්තෝප්පුවකට ගොස් නැවත නිදන්නට වූහ. සියලු දෙනාටම එහි ඉඩ තිබුණේ නෑ. සුළු වේලාවක් වුව එසේ නිදගන්න ලැබීම ලොකු සැනසිල්ලක් විය. පසුද අපට උණු තේ බොන්න ලැබුණි.

දියතලාවට යන්න සූදනම් වෙන්න කියා අණ ලැබුණු විට අපි සියලු දෙනාම මවිතයට පත් වුණෙමු.